ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

---

# 1980 අංක 2 දරන
# නාගරික සංවර්ධන ව්‍යාපෘති
# (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1980 ජනවාරි මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ: ශත 45 යි

තැපැල් ගාස්තුව: ශත 25 යි

# 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1980 ජනවාරි මස 14 වන දින.]

එල්. ඩී.—ඕ. 81/79.

**නාගරික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වහා අවශ්‍ය ඉඩම් ප්‍රකාශයට පත් කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1980 අංක 2 දරන නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. ජනතාවගේ පොදු ශුභ සිද්ධියේ යුක්තිසහගත අවශ්‍යතාවන් ඉටුවන නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යම් විශේෂිත ඉඩමක් හෝ යම් ප්‍රදේශයක වූ ඉඩම් හෝ වහා අවශ්‍ය බව, නාගරික සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයා විසින් කරන ලද නිර්දේශයක් මත, ජනාධිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඒ ඉඩම හෝ ඒ ප්‍රදේශයෙහි වූ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි ඉඩම් හෝ ඒ කාර්යය සඳහා අවශ්‍ය බව, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ජනාධිපතිවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය. නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා වහා අවශ්‍ය ඉඩම් ප්‍රකාශයට පත් කිරීම.

3. මේ පනතේ 2 වන වගන්තිය යටතේ කරන ලද හෝ කරන ලැයි අදහස් කරන ලද නියමයකින් අතෘප්තියට පත් කිසිම තැනැත්තකුට හෝ යම් විශේෂිත ඉඩමක හෝ ඉඩම්වල සම්බන්ධයෙන් හෝ යම් ප්‍රදේශයක වූ යම් ඉඩමක හෝ ඉඩම්වල සම්බන්ධයෙන් හෝ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ නැතහොත් මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ යයි අදහස් කර, කරන ලද හෝ කිරීමට යෝජිත යම් ක්‍රියාවකින් හෝ ගන්නා ලද හෝ ගැනීමට යෝජිත පියවරකින් බලපාන ලද හෝ බලපානු ලබන්නේ යයි සිතන කිසිම තැනැත්තකුට— 2 වන වගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයට පත්කිරීමක් සම්බන්ධයෙන් ලබාගත හැකි ප්‍රතිකර්ම සීමා කිරීම.

(අ) වන්දි හෝ අලාභ ලබා ගැනීම් වශයෙන් හැර, කිසිම ප්‍රතිකර්මයකට, සහනාදානයකට හෝ සහනයකට ;

(ආ) යම් තැනැත්තකු මණ්ඩලයක් හෝ අධිකරණයක් විසින්—

(i) එවැනි යම් ඉඩමක් හෝ එවැනි ප්‍රදේශයක වූ යම් ඉඩමක් අත්කර ගැනීම ;

(ii) එවැනි යම් ඉඩමක හෝ එවැනි යම් ප්‍රදේශයක වූ යම් ඉඩමක යම් වැඩක් ක්‍රියාත්මක කිරීම ;

(iii) ඒ ව්‍යාපෘතිය කවර වූ හෝ ආකාරයකින් ක්‍රියාවට නැංවීම

නතර කිරීමේ, වැළැක්වීමේ හෝ ඊට බාධා කිරීමේ ප්‍රතිඵලය ඇති නියත හෝ අතුරු ඉන්ජන්ක්ෂන් තහනමකට, වාරණ ආඥාවකට, නතර කිරීමේ ආඥාවකට හෝ වෙනත් යම් ආඥාවකට

හිමිකම් නොලැබිය යුතු ය.

ඒ 46830—11,800 (79/12.

පිටි ආඥා නිකුත් කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණ යට ඇති බලය.

4. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාවෙන් අභියාචනාධිකරණය වෙත පැවරී ඇති අධිකරණ බලය, මේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ හෝ ඒ යටතේ වෙතැයි අදහස් කෙරෙන නියමයක් කර ඇත්තේ යම් විශේෂිත ඉඩමක් හෝ යම් ප්‍රදේශයක වූ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද ඒ විශේෂිත ඉඩම හෝ යම් ප්‍රදේශයක වූ ඉඩම සම්බන්ධයෙන් වූ විට, අභියාචනාධිකරණය විසින් නොව, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා වූ සෑම ඉල්ලීමක් ම, ඒ ඉල්ලීම කරනු ලබන්නේ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ද නැතහොත් අදාලව ද ඒ ක්‍රියාව සිදු කළ දිනයෙන් එක් මාසයක් ඇතුළත, ඉදිරිපත් කළ යුතු අතර ඒ ඉල්ලීම ඉදිරිපත් කරනු ලැබීමෙන් මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එය විභාග කොට ඊට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු ය.

යම් අධිකරණයක විනිශ්චයට භාජනව පවත්නා ඉල්ලීම්, නඩු, නඩු කටයුතු සහ කාරණ සම්බන්ධ විධිවිධාන.

5. මේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ හෝ ඒ යටතේ වෙතැයි අදහස් කෙරෙන නියමයක් ජනාධිපතිවරයා විසින් කරනු ලබන අවස්ථාවක, ඒ නියමය පළ කරනු ලබන වේලාවේ, යම් අධිකරණයක, යම් විශේෂිත ඉඩමක් හෝ යම් ප්‍රදේශයක වූ යම් ඉඩමක් සම්බන්ධයෙන්, විනිශ්චයට භාජනව පවත්නා යම් ඉල්ලීමකට, නඩුවකට, නඩු කටයුතුවලට හෝ කාරණයකට, ඒ ඉල්ලීම, නඩුව, නඩු කටයුතු හෝ කාරණය මේ පනත බලාත්මක වීමට පෙර හෝ පසුව හෝ පවරනු ලැබ තිබුණ ද නැත ද, මේ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය ; තවද ඒ අනුව —

(අ) මේ පනතේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම් වස් හෝ ඊට අනුකූල වීම් වස් කලින් කරන ලද යම් ආඥාවක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට, වෙනස් කිරීමට හෝ සුළු වශයෙන් වෙනස් කිරීමට හෝ යම් උත්තරවාද සංශෝධනය කිරීමට යම් පාර්ශ්වකරුවකුට අවසර දීමට හෝ යම් පියවර ගැනීමට යම් පාර්ශ්වකරුවකුට අවසර දීමට හෝ අවශ්‍ය විය හැකි ආඥා කිරීමට හෝ අධිකරණයට හිමිකම තිබිය යුතු ය ;

(ආ) මේ පනතේ 4 වන වගන්තියේ විධිවිධාන කුමක් වුවද ඒ නියමය පළ කළ දිනයෙන් එක් මාසයක කාලසීමාවක් ඉකුත්වීමට පෙර, එම වගන්තියේ සඳහන් යම් ඉල්ලීමක් කිරීමට යම් පාර්ශ්වකරුවකුට හිමිකම් තිබිය යුතු ය ; තවද,

(ඇ) ඒ නියමය පළ කරනු ලබන වේලාවේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 140 වන ව්‍යවස්ථාව යටතේ අභියාචනාධිකරණය සතු අධිකරණ බලය ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා වූ යම් ඉල්ලීමක් ඒ අධිකරණයෙහි විනිශ්චයට භාජනව පවත්නා අවස්ථාවක, ඒ ඉල්ලීම ශ්‍රේෂ්ඨාධිකරණයට මාරු විය යුතු අතර ඒ නියමය පළ කරනු ලැබූ දිනයෙන් මාස දෙකක් ඇතුළත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඒ ඉල්ලීම විභාග කර අවසාන වශයෙන් ඊට සුදුස්සක් කළ යුතු ය.

6. මේ පනතේ 3 වන වගන්තියේ අඩංගු කිසිවක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ කරන ලද යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් හෝ මේ පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි සඳහන් අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා හෝ වෙනත් අයුරකින් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නීත්‍යනුකූලව ක්‍රියාත්මක කළ හැකි බලතල කෙරෙහි බල නොපෑ යුතු ය.

3 වන වගන්තිය ශ්‍රේෂ්ඨාධිකරණයේ බලතල කෙරෙහි බල නොපෑ යුතු බව

7. (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ හෝ ඒ යටතේ වෙතැයි අදහස් කෙරෙන නියමයක් පළ කර ඇත්තේ යම් විශේෂිත ඉඩමක් හෝ යම් ප්‍රදේශයක වූ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, ඒ ඉඩමේ සන්තකය, යම් නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමේ හෝ ක්‍රියාත්මක කිරීමට සහාය වීමේ හෝ කාර්යය සඳහා, ලබා ගැනීමට ආණ්ඩුවට හෝ යම් තැනැත්තකුට, මණ්ඩලයකට හෝ අධිකාරියකට අවශ්‍ය වන අවස්ථාවක, ආණ්ඩුව හෝ ඒ තැනැත්තා හෝ මණ්ඩලය හෝ අධිකාරිය විසින් 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ විධිවිධාන යටතේ පියවර ගැනීම නීත්‍යනුකූල විය යුතු ය ; තව ද ඒ අනුව—

1979 අංක 7 දරන පනතේ විධිවිධාන අදාළ වීම.

(අ) ඒ පනතේ අර්ථ කථනය කරනු ලැබ ඇති පරිදි වූ "රජයේ ඉඩම්" යන යෙදුමට එවැනි යම් තැනැත්තකුට, මණ්ඩලයකට හෝ අධිකාරියකට සතුවී ඇති හෝ අයිති වන නැත හොත් ඒ තැනැත්තා, මණ්ඩලය හෝ අධිකාරිය විසින් බැහැර කිරීමට හිමිකම් ඇති හෝ යම් ඉඩමක් ඇතුළත් විය යුතු ය ;

(ආ) "නිසි බලධරයා" යන යෙදුමට ඒ තැනැත්තා නැතහොත් ඒ මණ්ඩලයේ හෝ අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා හෝ ඇතුළත් විය යුතු ය.

(2) මේ පනතේ 2 වන වගන්තිය යටතේ වූ හෝ ඒ යටතේ වෙතැයි අදහස් කෙරෙන නියමයක් පළ කරනු ලැබ ඇත්තේ යම් විශේෂිත ඉඩමක් හෝ යම් ප්‍රදේශයක වූ යම් ඉඩමක් වෙනුවෙන් ද එවැනි ඉඩමක් සම්බන්ධයෙන් 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත යටතේ ඉදිරිපත් කරන ලද සෑම ඉල්ලීමකට ම, ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් දින තිහක් ඇතුළත අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු අතර ඒ ඉල්ලීම ඉදිරිපත් කිරීමෙන් දින හැටක් ඇතුළත සියලුම තැනැත්තන් එම ඉඩමෙන් ඉවත් කරවීම සහතික කිරීම සඳහා අවශ්‍ය සියලු ආඥා අධිකරණය විසින් කළ යුතු ය.

8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි, "ඉඩම" යන්නට, රජයට, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ පිහිටුවන ලද ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට, ජාතික නිවාස කොමසාරිස්වරයාට, යම් පළාත් පාලන ආයතනයකට හෝ වෙනත් යම් තැනැත්තකුට, මණ්ඩලයකට හෝ අධිකාරියකට සතු වී ඇති හෝ අයත් ඉඩම් ඇතුළත් වේ.

අර්ථ නිරූපණය.